# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.18 පැය 0550 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 83 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

**01. මනුෂ්‍ය ඝාතනයක් - කඹුරුපිටිය පොලිස් වසම.**

2025.01.17 වන දින උදෑසන කාලයේ කඹුරුපිටිය පොලිස් වසමේ රන්සෑගොඩ ප්‍රදේශයේ නිවසක ආරවුලක් හේතුවෙන් තියුණු ආයුධකින් පහරදී පුද්ගලයෙකු මියගොස් ඇති බවට කඹුරුපිටිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 65 ක් වන කොස්ගහහේන, රන්සෑගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අපරාධය සිදු වූ නිවසෙහි හිමිකාරියගේ ස්වාමිපුරුෂයා විදේශගතව සිටින අතර ඇය කලක සිට එම ප්‍රදේශයේ පදිංචි අපරාධය සිදුකල සැකකරු සමඟ අනියම් සම්බන්ධතාවයක් පවත්වාගෙන ගොස් ඇත. 2025.01.17 වන දින මොවුන් දෙදෙනා අතර ආරවුලක් ඇති වී ඇති අතර එම ආරවුල බේරීමට නිවසේ සිටි සේවකයෙකු (මරණකරු) හා අසල්වැසි නිවසක පදිංචි කාන්තාවක් මැදිහත්වීමේදී සැකකරු විසින් ඔහුගේ ඉනේ සඟවා තිබූ තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් පිරිමි පුද්ගලයා එම ස්ථානයේදීම මියගොස් ඇති අතර නිවසේ හිමිකාරිය හා අසල්වැසි කාන්තාව බරපතල තුවාල ලබා ඇත.

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසුව පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා කඹුරුපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කඹුරුපිටිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් - හබරණ පොලිස් වසම.**

2025.01.16 වන දින රාත්‍රී කාලයේ හබරණ පොලිස් වසමේ පලුගස්වැව ප්‍රදේශයේ නිවසක බිළිඳෙකු මියගොස් ඇති බවට 2025.01.17 වන දින හබරණ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මිය ගිය බිළිඳා වයස මාස 10 ක් වන බුලනගම, පලුගස්වැව ප්‍රදේශයේ පදිංචි පිරිමි දරුවෙකි.**

මිය ගිය බිළිඳා සිය මව, පියා සහ සහෝදරයා සහ සහෝදරිය සමඟ ඉහත ලිපිනයේ පදිංචිව සිට ඇති අතර පියා නිවසින් බැහැර ගොස් සිටියදී, 2025.01.16 වන දින රාත්‍රී කාලයේදී නිවස පිටුපස ඇති වතුර වළකට දරුවා දමා නැවත ගොඩට ගෙන නිවසේ ඇඳ මත තැබූ බවට මව විසින් ප්‍රකාශ කර ඇත. මෙය මනුෂ්‍ය ඝාතනයක්

බවට දැනට සිදුකරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත. අපරාධය සම්බන්ධයෙන් මිය ගිය බිළිඳාගේ මව අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 34 ක් වන පලුගස්වැව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසුව පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා පොලොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. හබරණ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. මනුෂ්‍ය ඝාතනයක් - වලස්මුල්ල පොලිස් වසම.

2025.01.16 වන දින රාත්‍රී කාලයේ වලස්මුල්ල පොලිස් වසමේ හොරේවෙල ප්‍රදේශයේ නිවසක් තුල කාන්තාවක් ඝාතනය කර ඇති බවට 2025.01.17 වන දින වලස්මුල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 61 ක් වන හොරේවෙල, වලස්මුල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය නිවසෙහි තනිව පදිංචිව සිට ඇති අතර ඇයගේ හිසෙහි පහරදීමකින් සිදු වූ තුවාල සිදුව තිබී ඇති අතර මෙය ඝාතනයක් බවට සිදුකරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය තංගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරු අත්අඩංගුවට ගැනීමට වලස්මුල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වාද්දුව පොලිස් ස්ථානය.

2025.01.17 වන දින උදෑසන කාලයේ වාද්දුව පොලිස් වසමේ වාද්දුව දුම්රිය පොල අසලදී, වාද්දුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාද්දුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාශය.

2025.01.17 වන දින උදෑසන කාලයේ පැලියගොඩ පොලිස් වසමේ තොටළඟ ප්‍රදේශයේදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 13 මිලිග්‍රෑම් 100 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන කැළණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් ස්ථානය.

2025.01.17 වන දින උදෑසන කාලයේ ගම්පහ පොලිස් වසමේ ගම්පහ දුම්රියපොල අසලදී ගම්පහ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 700 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 07. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නිට්ටඹුව පොලිස් ස්ථානය

2025.01.17 වන දින සවස් කාලයේ නිට්ටඹුව පොලිස් වසමේ වීරසූරිය කන්ද ප්‍රදේශයේදී නිට්ටඹුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 590 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන අල්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නිට්ටඹුව පොලීසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 08. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2025.01.17 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන වැල්ල ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 09. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමශර්න කාර්යංශය.

2025.01.17 වන දින සවස් කාලයේ මෝදර පොලිස් වසමේ මෝදර බෝගහ හන්දිය ප්‍රදේශයේදී කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමශර්න කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 55 මිලිග්‍රෑම් 550 ක් හා ජාවාරමෙන් උපයන ලද මුදල් බවට සැක කරන රුපියල් 80,000/- ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු හා **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 730 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මෝදර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 32 හා 45 වයස්වල පසුවන රාජගිරිය හා අංගොඩ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

පළමු සැකකරු සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් සමඟ සමීප සම්බන්ධතා පවත්වමින් මත්ද්‍රව්‍ය ජාවාරම් සිදුකර ඇති බවට විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෝදර පොලිසිය හා කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කායර්ංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 10. තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද සිගරට් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.

2025.01.17 වන දින දහවල් කාලයේ කළුතර උතුරු පොලිස් වසමේ උග්ගල්බඩ හා වස්කඩුව ප්‍රදේශවලදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදුකර විදේශීය රටක සිට **තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද සිගරට් 3100 ක්** සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන වස්කඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර සැකකාරිය වයස අවුරුදු 37 ක් වන කළුතර උතුර ප්‍රදේශයේ පදිංචිකාරියක් වේ.**

කළුතර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඌරගස්මංහන්දිය පොලිස් ස්ථානය.

2025.01.17 වන දින උදෑසන කාලයේ ඌරගස්මංහන්දිය පොලිස් වසමේ යටගලකන්ද ප්‍රදේශයේදී ඌරගස්මංහන්දිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන යටගලකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඌරගස්මංහන්දිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - ගල්කිස්ස පොලිස් වසම.

2025.01.17 වන දින උදෑසන කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ජයසුමනාරාම මාගර්යේ ලුනාව ඇළෙහි කාන්තා මෘත ශරීරයක් ඇති බවට ගල්කිස්ස පොලිස්ස ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරියගේ අනන්‍යතාවය මෙතෙක් අනාවරණය වී නොමැත.**

ගල්කිස්ස පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 13. දියේ ගිලී අතුරුදහන්වීමක් - නවගමුව පොලිස් වසම.

2025.01.17 වන දින උදෑසන කාලයේ ඉහළ බෝමිරිය තොටුපල අසළින් කැළණි ගඟෙහි පීනමින් සිටි පුද්ගලයෙකු දියේ ගිලී අතුරුදහන් වී ඇති බවට නවගමුව පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත. අනතුරුව පොලීසිය, ප්‍රදේශවාසීන්ගේ සහාය ඇතිව අතුරුදහන් වූ පුද්ගලයාගේ මෘත ශරීරය සොයා ගන්නා ලදී.

**මරණකරු වයස අවුරුදු 61 ක් වන කඩුවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මුල්ලේරියාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නවගමුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 14. හදිසි ගින්නක් - මස්කෙලිය පොලිස් වසම.

2025.01.17 වන දින රාත්‍රී කාලයේ මස්කෙලිය පොලිස් වසමේ මාවුස්සාකැලේ වත්ත ප්‍රදේශයේ ලැයිමක හදිසි ගින්නක් හටගෙන ඇති බවට මස්කෙලිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් ලැබී ඇත. ඒ අනුව පොලිසිය වහාම ක්‍රියාත්මක වී ප්‍රදේශවාසීන්ගේ සහාය ඇතිව ගින්න මැඩපවත්වා ඇත.

ගින්න ඇති වීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. ගින්නෙන් ජීවිත හානි හෝ තුවාල කිසිවක් සිදුව නොමැති අතර නිවාස 08 කට පමණ හානි සිදු වී ඇත. මස්කෙලිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 15. මාරක රිය අනතුරක් - අහුංගල්ල පොලිස් වසම.

2025.01.17 වන දින දහවල් කාලයේ අහුංගල්ල පොලිස් වසමේ ගාල්ල කොළඹ ප්‍රධාන මාගර්යේ බලපිටිය බස් නැවතුම්පොල අසලදී, බස් රථය බස් නැවතුම්පොලේ නවතා නැවත ගමන් ආරම්භ කිරීමේදී, බස් රථයට නැඟීමට පැමිණි කාන්තාවක් බස් රථයේ ඉදිරිපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් එම කාන්තාව බරපතල තුවාල ලබා බලපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 74 ක් වූ අම්බලන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය බලපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. අහුංගල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**